සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11 ශ්‍රේණිය	ශිල්ප කලා - I	කාලය நேரம் Time	පැය 01යි


නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4)පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න**

1. ශ්‍රී ලාංකීය ජන කලා සුරැකීම සඳහා රජය විසින් ගෙන ඇති වඩාත් ඵලදායී ක්‍රියා මාර්ගයක් වන්නේ,
   I. ජන කලා පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු සෑම නගරයකම ප්‍රදර්ශනය කිරීමය
   II. ජනකලා නිර්මාණයේ සඳහා ජනපද පිහිටුවීමය
   III. ජන කලා ශිල්පීන්ට දිරි දීමනා ලබාදීමය
   IV. ජන කලා ආශ්‍රිත සියලු නිෂ්පාදන රජය විසින් මිලදී ගැනීම හා අලෙවි කිරීමය

2. කෙටි සරල රේඛා ඛණ්ඩයක් නිවැරදිව සම කොටස්වලට බෙදීමට කෝදුව සහ පැන්සල සමග භාවිත කළ යුතු ජ්‍යාමිතික උපකරණය කුමක්ද?
   I. බෙදුම් කටුව II. කවකටුව III. කෝණමානය IV. විහිත චතුරස්‍රය


3. කාර්මික චිත්‍ර ඇඳීමේදී විවිධ සම්මත රේඛා වර්ග භාවිත කරනු ලැබේ පහත රූප සටහනේ මිනුම් දැක්වීමට භාවිත කර ඇති සම්මත රේඛා වර්ගය වන්නේ



   I. අඛණ්ඩ සන රේඛාය
   II. අඛණ්ඩ සිහින් රේඛාව
   III. දෙකෙළවර සන දාම රේඛාය
   IV. දෙකෙලවර සිහින් දාම රේඛාය

4. කඩදාසි සඳහා ජාත්‍යන්තරව සම්මත වූ ප්‍රමාණයක් ඇත. ඒ අනුව A_0 කඩදාසියකින් A_3 කඩදාසි කොපමණ සකස් කරගත හැකිද?
   I. 08 II. 12 III. 14 IV. 16


5. රූපයේ දැක්වෙන ජ්‍යාමිතික හැඩතලයේ ඇති විශේෂ ලක්ෂණ ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න



   I. කෝණයක අගය 90^o ක් වන අතර විකර්ණ සෘජුකෝණීව සමච්ඡේදනය නොවේ
   II. සෘජුව ම පාද සමාන වන අතර ශීර්ෂ කෝණ සමච්ඡේදනය නොවේ
   III. විකර්ණ අසමාන වන අතර පාද සමාන්තර වේ
   IV. කෝණයක අගය 90^0 ක් වන අතර විකර්ණ එකිනෙක සමාන වේ

6. භෞතික වස්තුවක් නිර්මාණය කිරීමට පෙර එහි සැලැස්ම ඇඳීම සඳහා අවශ්‍ය වන්නේ එම වස්තුවේ
   I. රූපීය පෙනුමය II. සෘජු ප්‍රක්ෂේපණ පෙනුමය
   III. විකසන පෙනුමය IV. ඉදිරි පෙනුමය


7. රූපයේ දක්වා ඇති ත්‍රිකෝණය නිවැරදිව අර්ථ දක්වා ඇති පිළිතුර කුමක්ද?



   I. සෘජුකෝණී විෂම පාද ත්‍රිකෝණයකි
   II. සුළුකෝණී විෂම පාද ත්‍රිකෝණයකි
   III. මහා කෝණී විෂම පාද ත්‍රිකෝණයකි
   IV. සමකෝණී විෂම පාද ත්‍රිකෝණයකි

Past Papers Wiki

8. මෙම රූපයේ BC කොටස තුළ කවකටුව භාවිතයෙන් නිර්මාණය කළ හැකි කෝණවල අගයන් ඇතුළත් වර්ණය වන්නේ



I. $15^0, 22^0, 30^0, 70^0$ II. $15^0, 30^0, 45^0, 60^0$

III. $22^0, 30^0, 40^0, 75^0$ IV. $45^0, 65^0, 75^0, 85^0$

9. සුළුකෝණි විෂම පාද ත්‍රිකෝණයක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න


I. එක් කෝණයක් 90° වන අතර පාද තුනම අසමාන වේ.

II. පාද තුනම එකිනෙක අසමාන වන අතර කෝණ තුනෙහි අගයයන් ද අසමාන වේ

III. එක් කෝණයක් 60° වන අතර පාද සියල්ල සමාන වේ

IV. එක් කෝණයක් 90° ට වඩා අඩු වන අතර පාද දෙකක් සමාන වේ

10. ඉලිප්සයක වක්‍රය මත පිහිටි ඕනෑම ලක්ෂ්‍යයක් එම ඉලිප්සයේ නාභි දෙක සමඟ යා කිරීමෙන් ලැබෙන රේඛා දෙකේ එකතුව සමාන වන්නේ,



I. මහා අක්ෂයේ දිගට ය II. සුළු අක්ෂයේ දිගට ය

III. නියාමක අක්ෂයේ දිගට ය IV. නාභි දෙක අතර දුරටය

11. ඝන වස්තුවක මුහුණතක සැලසුම් චිත්‍රයක් රූපයෙන් දැක්වේ.එම ඝන වස්තුව වන්නේ,

I. ඝනකයකි II. ප්‍රිස්මයකි

III. කේතුවකි IV. සිලින්ඩරයකි

12. තිරාරමු මුද්‍රණයේදී රෙදිපිළි සඳහා බහුලව භාවිත කරනුයේ කුමන සායම් විශේෂය ද?

I. ෆැබ්රික් පේන්ට් II. පිග්මන්ට් සායම්

III. නැප්තෝල් සායම් IV. ඉමල්ෂන් සායම්

13. රෙදි අලංකරණයේදී පෙර පිරියම් හා පසු පිරියම් යන ක්‍රමවේද අනුගමනය කරනු ලබයි.ඒ. අතරින් රෙදි වල දුඹුරු පැහැය ඉවත් කර සුදු පැහැය ලබා ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ ,

I. කැළඹරණය II. කාබනීකරණය III. විරංජනය IV. මළහරණය

14. මෝනොක්‍රෝම් වර්ණයක් සකස් කිරීමට යොදා ගත යුතු වර්ණ කාණ්ඩය අයත් වරණය තෝරන්න

I. ප්‍රාථමික වර්ණයක් ,සුදු වර්ණය හා කළු වර්ණය

II. ප්‍රාථමික වර්ණ ,ද්විතීයික වර්ණ හා සුදු වර්ණය

III. ප්‍රාථමික වර්ණයක්,තෘතීයික වර්ණය සහ කළු වර්ණය

IV. ප්‍රාථමික වර්ණය,ද්විතීයික වර්ණය සහ තෘතීයික වර්ණය

15. කෙඳි හඳුනා ගැනීමේ සරල පරීක්ෂණ අතරින් ස්පර්ශ කිරීමේ පරීක්ෂණයක දී උෂ්ණ ගතිය සහිත ඇදුම් දෙන ගතිය හා උඩට තෙරපෙන ස්වභාවයන් දැක ගත හැකි කෙඳි වර්ගය වනුයේ,

I. සේද II. ලෝම III. ලිනන් IV. කපු

16. බතික් නිර්මාණ සිදු කිරීමේදී අලංකාර සියුම් රේඛා ලබා ගැනීමට අවශ්‍ය වූ විටෙක ඉටි මිශ්‍රණය සකස් කර ගත යුතු වන්නේ,

I. පැරපින් ඉටි ප්‍රමාණය වැඩිකර ගැනීමෙනි II. මී ඉටි අනුපාතය වැඩිකර ගැනීමෙනි

III. රට දුම්මල ප්‍රමාණය වැඩිකර ගැනීමෙනි IV. මී ඉටි සහ රට දුම්මල සමාන අනුපාතයෙන් යෙදීමෙනි

17. චිත්‍ර හැකියාව අඩු අයෙකුට සාර්ථකව රෙදිපිළි අලංකාරණය සඳහා තාප බන්ධිත ක්‍රමය යොදා ගනී.එහිදී කපු රෙදි සඳහා භාවිත වන කඩදාසියේ වර්ණය වන්නේ?

I. දම් II. කළු III. නිල් IV. රතු

18. ටැබ්ලට් පෙති භාවිතයෙන් විසිතුරු ඉණ පටියක් සකස් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර කිහිපයක් පහත දැක්වේ.

A - නූල් ගැලවීයාම වැලැක්වීම සඳහා නූල් කොන් පිළිස්සීම C - ටැබ්ලට් පෙතිවල අංක අනුව නූල් දික්ගසා ගැනීම

B - ශක්තිමත් නයිලෝන් නූලක් සපයා ගැනීම D - හරස් නූල් යොදා පෙති කරකවමින් වියා ගැනීම

එම පියවර නිවැරදි අනුපිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න

I. A,B,C,D II. B,A,C,D III. C,A,D,B IV. D,C,B,A

19. මැසිම,එම්බ්‍රොයිඩර් කිරීම,වර්ණාලේප කිරීම ආදියෙන් තොරව රත්කර ඇලවීම මගින් රෙදිපිළි අලංකාර කර ගැනීමට භාවිත කළ හැකි ආකාරයට වෙළඳ පොළට පැමිණ ඇති කඩදාසි විශේෂය හඳුන්වන්නේ,

I. වාර්නිෂ් කඩදාසි II. වැලි කඩදාසි III. තාප බන්ධිත කඩදාසි IV. දිස්න කඩදාසි

20. කෙඳි වර්ගය අනුව නුල් කැරැල්ලක සම්මත දිග විවිධ වේ.කපුනුල් කැරළි 10ක් නුල් රාත්තලකට අඩංගු නම් එම නුල්වල දිග යාර කීයද?

I. 300 x10 = 3000 II. 560 x10 =5600 III. 800x10 =8000 IV. 840x10 = 8400

21. කැරළි වශයෙන් වෙළඳපොලෙන් ලබා ගන්නා නුල් භාවිතය සඳහා ඔතා ගැනීම සිදු කරයි.එසේ නුල් ඔතා ගැනීමට යොදා ගන්නා ප්‍රධාන උපකරණ වනුයේ,

I. එතුම් කුර II. එතුම් රෝදය

III. එතුම් රෝදය හා කරුව සහිත මල් චක්‍රය IV. මල් චක්‍රය

22. මෙට්‍රික් අංක 20 වූ තනිපට නුල් කැරළි මිටියක බර 6 kg කි.එහි අඩංගු නුල් කැරළි ගණන කියද?

I. 6 II. 60 III. 20 IV. 120


23. දිග මීටර් 60 ද පළල 30cm ක් වූ මේස ඇතුරුම් හැදයක් විවීම සඳහා 1cm ට නුල් පොටවල් 40ක් යොදා ගෙන ඇත.එම හැදයේ ඇති මුළු නුල් පොටවල් ගණන කීයද?


I. 30 x60=1800 II. 30 x40 =1200 III. 40 x60 =2400 IV. 60x30x40 =72000


24. බඳුන් පලස් හැදයක් විවීම සඳහා නුල් 4kg ක් වැයවූ අතර එහි දෙපට නුල් කැරළි 80ක් අඩංගු වී තිබුණි.එම නුලේ අංකය මීන් කුමක්ද?


I. $2/40^s$ II. $2/60^s$ III. $2/80^s$ IV. 80^s

25. අත් යන්ත්‍රයකින් මේස රෙද්දක් විවීම සඳහා දික් නුලක් සමග හරස් නුල් දෙකක් හෝ තුනක් භාවිත කර ඇත.එම වියමන් රටාව පහත රූප සටහන් අතරින් තෝරන්න.


I. 


II. 


III. 


IV. 

26. පහත වියමන් රටා පිළිවෙළින් නිවැරදිව නම් කර ඇති වරණය තෝරන්න

I. 

II. 

III. 

IV. 

I. දගර හිරි,සරල හිරි,රුවිත හිරි,කඩහිරි II. රුවිත හිරි,සරල හිරි,දගර හිරි,කඩහිරි

III. කඩහිරි,රුවිත හිරි,දගර හිරි,සරල හිරි IV. කඩහිරි,රුවිතහිරි,සරල හිරි,දහර හිරි

27. නුලක ඇඹරුම් ප්‍රමාණය අනුව නුල් වර්ග කරනු ලබයි.අංක 60^s සිට 100^s දක්වා අංක කර ඇත්තේ කුමන නුල් ද?

I. සිහින් නුල් II. මහත නුල් III. මධ්‍යම නුල් IV. තනිපට නුල්

28. මැටි භාණ්ඩ නිෂ්පාදනයේදී ප්‍රාථමික මැටි හෙවත් පිහිටි මැටි භාවිතයෙන් කරන නිෂ්පාදන වන්නේ,

I. උළු,ගඩොල් සහ විසිතුරු භාණ්ඩ II. බිම් ගඩොල්,මල් බඳුන් සහ වලං

III. පෝසිලේන් භාණ්ඩ ,දන්තාලේප සහ පුයර IV. ගිනිගල්,පෝරණු උපාංග සහ ආවරක පෙට්ටි


29. ඇලුමිනා සිලිකේට් ලෙස රසායනිකව හඳුන්වන භාණ්ඩ නිෂ්පාදනයට භාවිත කෙරෙන මැටිවල අන්තර්ගත සංයෝග වන්නේ,

I. ඇලුමිනියම් ඔක්සයිඩ්, ටයිටේනියම්, ජලය
II. සිලිකන් ඔක්සයිඩ්, ඇලුමිනියම් ඩයොක්සයිඩ්,ජලය
III. ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන් ඩයොක්සයිඩ්, ජලය
IV. සිලිකන් ඩයොක්සයිඩ්,මැග්නීසියම්,ජලය

30. ප්‍රමිතිගත භාණ්ඩයක් නිර්මාණය කර ගැනීම සඳහා මැටිවල තිබිය යුතු භෞතික හා රසායනික ගුණ වන්නේ,

I. සුවිකාර්යතාව,සවිවරතාව,වර්ණය,හැකිලීම
II. ඝනත්වය,හංගුරතාව,සක්‍යතාව,වර්ණය
III. න්‍යතාව,නම්‍යතාව, හංගුරතාව, වර්ණය
IV. සක්‍යතාව,අනම්‍යතාව, ඝනත්වය, වර්ණය

31. පහත රූපයේ දක්වා ඇති මැටි භාණ්ඩය සකස් කිරීම සඳහා භාවිත කරන ලද ශිල්ප ක්‍රමය වන්නේ,



I. මැටි දරණු භාවිතය
II. මැටි තහඩු භාවිතය
III. සකපෝරුව භාවිතය
IV. නිදහස් අතින් සැකසීම

32. මැටි භාණ්ඩ අලංකාර කිරීම සඳහා කඩදාසි,කැබලිවලට ඉරා අලවා ගැනීමෙන් ද විසිතුරු නිර්මාණ සකස් කර ගැනේ. එම ක්‍රමය හඳුන්වන්නේ,

I. කොලාජ් ක්‍රමය
II. ඩෙකෝපාජ් ක්‍රමය
III. පල්ප ක්‍රමය
IV. ස්ටෙන්සිල් ක්‍රමය

33. දේශීය පෝරණුවක මැටි භාණ්ඩ පිළිස්සීමේදී යෙදිය හැකි උෂ්ණත්ව පරාසය කුමක්ද?

I. 850°- 900°c
II. 900°c - 950°c
III. 1000°c - 1200°c
IV. 1250 ^{0}C - 1350 ^{0}C

34. මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී ඒවා අලංකාර කිරීමේ විවිධ අවස්ථා පවතී.ඒ අනුව කැටයම් කැපීම කරනු ලබන්නේ කුමන අවස්ථාවේදී ද?

I. නිෂ්පාදන අවස්ථාවේදී
II. හම පදම් අවස්ථාවේදී
III. පළමු පිලිස්සීමෙන් පසු අවස්ථාවේදී
IV. භාණ්ඩ හොඳින් වියලි ඇති අවස්ථාවේදී

35. නිවසක් ඉදිරිපිට ගෙවත්තේ එළිමහන් ස්ථානයකට සුදුසු උද්‍යාන අලංකරණ උපාංගයක් නිර්මාණය කිරීමට වඩාත් සුදුසු වන්නේ

I. පල්ප මාධ්‍ය නිර්මාණයකි
II. මැටි මාධ්‍ය නිර්මාණයකි
III. සිමෙන්ති මාධ්‍ය නිර්මාණයකි
IV. ලෝහ මාධ්‍ය නිර්මාණයකි

36. ශ්‍රී ලංකාවේ අන්තර් කලාපිය මැටි නිධි පිහිටා ඇති ප්‍රදේශ වන්නේ,

I. කොච්චිකඩේ සහ අලුත් නුවර
II. කැලණිය සහ බෙන්තොට
III. අනුරාධපුර සහ ඔඩ්ඩුසුඩාන්
IV. බංගදෙනිය සහ ගල්ඔය


37. පාන් ක්ලේ මිශ්‍රණයකින් භාණ්ඩයක් අලංකාර කිරීමේ දී කල්තබා ගැනීම සඳහා එක් කරනු ලබන්නේ මොනවාද?

I. බයින්ඩර් ගම්
II. අවර්ණක වාර්නිෂ්
III. කපුරු කුඩු
IV. වර්ණක

38. මැටි භාණ්ඩ වලට දිස්න යොදා ඉහල උෂ්ණත්වයට ලක් කිරීම සිදු කරන්නේ

I. මූලික පිළිස්සීමේදී
II. නිදුලකටු පිළිස්සීමේදී
III. බිස්කට් පිළිස්සීම
IV. ද්විතියික පිළිස්සීම

39. කුඩා දරුවන්ට පැළඳීම සඳහා වුල් ගෙතුම් යොදා ගනි.මෙහි රූපයේ සඳහන් ගෙතීමේ රටාව වන්නේ,



I. දම්වැල් ගෙතීම
II. පත්තෑයා ගෙතුම
III. කුකුළු ගෙතුම
IV. තුන්පට පිරිවිලි ගෙතුම

40. කඩදාසි තිරූ පටි මගින් නිර්මාණ කර ආර්ථික වාසි ලබා ගත හැකිය.එම නිර්මාණ කිරීමේ පියවරක් නොවන්නේ,

I. කඩදාසි පටි තිරූ කපා ගැනීම
II. කඩදාසි එකින් එක තබා කැපීම
III. කඩදාසි අවශ්‍ය ප්‍රමාණයට ලිහිල් කිරීම
IV. කඩදාසි පටි රෝල් කිරීම

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11 ශ්‍රේණිය	කාලය நேரம் Time: පැය 02යි
ශිල්ප කලා - II		

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

* සැ.යු. පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1. ඔබ පාසලේ පුස්තකාල සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා පාසල් සිසුන් විසින් සැකසූ නිර්මාණ ඇතුලත් වෙළඳ සල්පිලක් සහ ප්‍රදර්ශනයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.
   i. ශිල්පකලා විෂය හදාරන සිසුන්ට ප්‍රදර්ශන භාණ්ඩ ඉදිරිපත් කළ හැකි විෂය ක්ෂේත්‍ර හතරක් නම් කරන්න.
   ii. සියලු ම පාසල් සිසුන් සහභාගි විය යුතු මෙම ප්‍රදර්ශනය සඳහා භාණ්ඩ ඉදිරිපත් කළ හැකි විෂයට සමගාමීව නිර්මාණය ඉදිරිපත් කළ හැකි තවත් විෂය ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.
   iii. ආරාධිත ප්‍රධාන අමුත්තා පිළිගැනීම සඳහා කෘත්‍රිම මල් භාවිතයෙන් මල් කලඹක් සැකසීමට තීරණය විය. එවන් අවස්ථාවක කෘත්‍රිම මල් භාවිතයෙන් ඇති වාසි දෙකක් ලියන්න.
   iv. ප්‍රදර්ශන කාර්ය මණ්ඩලයට පැළැඳීම සඳහා නිකුත් කළ හැකි ලාංඡනයක දළ සැලැස්මක් අඳින්න.
   v. පිවිසුම් දොරටුව අලංකාර කිරීම සඳහා ගොක්කොළ හා පොල්කොළ භාවිත කර වියා ගැනීමට අපේක්ෂා කරන ජටා වියමනක ඒකක දෙකක් ඇඳ දක්වන්න.
   vi. ප්‍රදර්ශනයට තැබීම සඳහා ජ්‍යාමිතික හැඩතල ආශ්‍රයෙන් සකස් කරන ලද කාන්තා බෑග් හතරක් සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩතල අඳින්න.
   vii. 10% ක ලාභයක් ඇති වන සේ භාණ්ඩවල මිල නියම කිරීමට උපදෙස් ලැබී ඇත.අත් බෑගයක නිෂ්පාදන වියදම රු.150 නම් වෙළඳපොල සඳහා වන මිල නියම කරන්න.
   viii. ප්‍රදර්ශනයට තැබීම සඳහා සකස් කරන මැටි භාණ්ඩ අලංකාර කිරීමට යොදා ගත හැකි පාරම්පරික අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.
   ix. ප්‍රදර්ශනය නැරඹීමට ආරාධිතයින්ට යැවිය යුතු ආරාධනා පත්‍රයේ ආකෘතියක් ඇඳ පෙන්වන්න.
   x. උත්සව අවස්ථාවේ දැල්වීමට සුදුසු පරිසර සම්පත් ඇසුරින් නිර්මාණය කළ හැකි පොල් තෙල් පහනක ආකෘතියක් ඇඳ දක්වන්න.

2. විවිධ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කරන්නා වූ භාණ්ඩය සඳහා සැලසුම් චිත්‍ර ඇඳීමේ දී ජ්‍යාමිතික ඇඳීම විෂයයක් ලෙස භාවිතයට ගැනේ.
   1. 60° කෝණයක් නිර්මාණය කර එය A, B, C ලෙස නම් කර සමච්ඡේදනය කරන්න.
   2. සැහැල්ලු සෙල්ලම් බඩු ගණයට ගැනෙන පංචාස්‍ර බෝලය නිර්මාණය කිරීමට අවශ්‍ය සවිධි පංචාස්‍රය ඕනෑම ක්‍රමයකට නිර්මාණය කරන්න.
   3. සෙන්ටිමීටර් 5ක් දිග සෙන්ටිමීටර් 3ක් පළල සෙන්ටිමීටර් 2ක් උස ඝනකාභයේ විකාශනය අඳින්න.

PAST PAPERS WIKI

3. වර්තමානයේ රෙදිපිළි අලංකරණ ක්‍රම සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. සාම්ප්‍රදායික ක්‍රම අභිබවා නවීන ක්‍රම ද භාවිතයට ගැනේ.

   i. තීන්ත භාවිතයෙන් තොරව රෙදි පිළි අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.

   ii. ඉහත නම් කරන ලද එක් ක්‍රමයකට අනුව රෙදි පිළි අලංකාර කරන අයුරු පියවර සහිතව ලියන්න.

   iii. පිළි අලංකරණයේ දී භාවිතා කරන සේද රාමු මුද්‍රණයට යොදණු ලබන මෝස්තරයක් ඇඳ පෙන්වන්න.

4. විවීමේ යන්ත්‍ර භාවිතයෙන් ඇඳ ඇතිරිලි හැඳයක් වියා ගැනීමට අපේක්ෂිතය ඒ සඳහා සකස් කරන ලද නූල් හැඳයේ තොරතුරු පහත දැක්වේ.

   - හැඳයේ දිග 50cm
   - හැඳයේ පළල 48cm
   - සෙන්ටිමීටර් එකකට නූල් පොටවල් 32යි
   - නූල් අංකය 2/40s
   - නූලේ වර්ණය සුදු

   i. හිරි වියමන් ප්‍රභේද හතරක් නම් කරන්න.

   ii. හිරි වියමන් ප්‍රභේදයකින් එක් රටාවක නූල් මතු වීම ප්‍රස්ථාර ගත කරන්න.

   iii. හැඳයට අවශ්‍ය වන නූල් ප්‍රමාණය ගණනය කරන්න.

5. නූල් භාවිත කර විවීම මෙන්ම ගෙතීම ද ඈත අතීතයේ සිට පැවත එන කර්මාන්තයක් ලෙස දැක්විය හැකිය.

   i. ගෙතීම මඟින් ගෘහ අලංකරණ ලෙස නිපදවන නිර්මාණ හතරක් නම් කරන්න.

   ii. විවීම සඳහා යන්ත්‍ර ගත කිරීමට නූල් සමූහය හැඳයක් ලෙස දික් ගසා ගත යුතු වෙයි දික් ගැසීමේ උපකරණ කට්ටලය නම් කරන්න.

   iii. රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේ අත් යන්ත්‍රයක ඇති ලීවර් රාමුව හා අළුව යන උපාංග වලින් සිදු කරන කාර්යය ලියන්න.

6. භූගත සම්පතක් වන මැටි නිධි වශයෙන් පොළොවේ තැන්පත් ව ඇති අතර ඒවා කැනීම් කර පිටතට ගෙන පදම් කොට භාණ්ඩ නිෂ්පාදනය කෙරේ.

   i. මැටි පදම් කිරීමේ ක්‍රම කීයද? ඒවා මොනවාද?

   ii. මැටි භාණ්ඩ පිලිස්සීමෙන් පසු සිදුවන වෙනස්කම් හතරක් ලියන්න.

   iii. මැටි භාණ්ඩ අලංකරණ ක්‍රම දෙකක් නම් කර ඉන් එක් ක්‍රමයකට අනුව භාණ්ඩ අලංකාර කරන අයුරු පැහැදිලි කරන්න.

7. නිවාස සැලසුම්කරණයේ දී උද්‍යාන අලංකරණය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරයි.

   i. උද්‍යාන අලංකාරණ නිර්මාණයේ දේ සැලකිලිමත් විය යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම හතරක් නම් කරන්න.

   ii. උද්‍යාන අලංකාරණ සඳහා භාවිතා කරන මාධ්‍ය දෙකක් නම් කර ඉන් එක් මාධ්‍යයක් භාවිතා කර නිර්මාණය කළ නිර්මාණයක දළ රූප සටහන අඳින්න.

   iii. අච්චු නිර්මාණ මැටි ශිල්පයේ දී ප්‍රධාන වන අතර සරල අච්චුවක් සකස් කරන අයුරු පියවර සහිතව ලියන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank